# ධම්මපදය

## පුප්ඵ වර්ගය (10 ගාථාව)

**10. ගාථාව**

**යථාපි පුප්ඵරාසිම්හා - කයිරා මාලාගුණේ බහූ,**
**ඒවං ජාතේන මච්චේන - කත්තබ්බං කුසලං බහුං.**

**පදගතාර්ථය**

| | | |
|---|---|---|
| **යථාපි** | - | යම් සේ |
| **පුප්ඵරාසිම්හා** | - | මල් රැසකින් |
| **බහූ** | - | බොහෝ |
| **මාලාගුණේ** | - | මල්දම් |
| **කයිරා** | - | කරන්නේ ද |
| **ඒවං** | - | එසේ (ම) |
| **ජාතේන** | - | උපන් |
| **මච්චේන** | - | සත්ත්වයා විසින් |
| **කත්තබ්බං** | - | කටයුතු |

**භාවාර්ථය**

(දක්ෂ වූ මාලාකාරයෙක්) මල් රැසක් එක්කොට එයින් බොහෝ මල්දම් ගොතන්නේ යම්සේ ද, එසේ ම උපන් සත්ත්වයා විසින් ද බොහෝ කුසල් කළ යුතු ය.

**නිදන කථාව**

දඹදිව අගුරට භද්දිය නුවර මෙණ්ඩක නම් මහාසිටුවරයෙක් විය. ඔහුගේ පුත්‍ර තෙමේ ධනඤ්ජය නම් විය. ධනඤ්ජය සිටුවරයාගේ දේවිය සුමනා නම් වූවා ය. මේ දෙමහල්ලන්ගේ දියණිය මහාවිශාඛාවෝ ය.

මෙණ්ඩක සිටු, ඔහුගේ භාර්යාව වූ චන්‍දපදුමා, වැඩිමහලු පුත් ධනඤ්ජය, ධනඤ්ජයගේ භාර්යාව වූ සුමනා, මෙණ්ඩක සිටුගේ සේවක වූ පුණ්ණ යන මොවුහු පස්දෙන මහපිනැතියෝ ය. විශාඛාව වයසින් සත් හැවිරිදි කල්හි, දිනක් බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා සමඟ භද්දිය නුවරට වැඩම කළ සේක. එකල්හි මෙණ්ඩක සිටු තෙමේ තම මිණිබිරිය වූ විශාඛාවන් සමඟ එහි ගොස් බණ ඇසී ය. එහි දී දෙදෙනා ම සෝවාන් වූහ.

පසේනදී කොසොල් රජු හා බිම්බිසාර රජතුමා යන රජවරු දෙදෙන භගිනිපතික වෙති. මේ මිතුදම හා ඥාති සම්බන්ධය මත දිනක් කොසොල් රජතුමා 'බිම්බිසාර රජුගේ රාජ්‍යයෙහි අපමණ සම්පත් ඇත්තෝ (අමිතභෝගී) පස්දෙනෙක් වෙසෙති. මාගේ රාජ්‍යයෙහි එබඳු එක් අයෙක්වත් නැත. එහෙයින් එක් අයෙකු ඉල්ලා ගනිමි'යි සිතා ගොස් බිම්බිසාර රජුගේ මාර්ගයෙන් ධනඤ්ජය සිටු ඇතුළු පිරිස කැමති කරවා ගෙන ගොස් කොසොල් රජුගේ රාජ්‍යයේ අගනුවර වන සැවැත් නුවරට සත් යොදුනක් ඈතින් පිහිටි ස්ථානයක නගරයක් කොට පදිංචි කරවී ය. එය සාකේත නුවර නමින් ප්‍රසිද්ධ විය.

සැවැත් නුවර මිගාර සිටුගේ පුත් පූර්ණවර්ධන සිටුකුමරුට සුදුසු පස්කලණින් යුත් කුමාරිකාවක් සොයන බමුණෝ ගම් නියම්ගම් නුවර සැරිසරා කුමාරිකාවක් සොයා ගැනුමට නො හැකි ව සාකේත නුවරට පැමිණියෝ ය. එදින එහි සැනකෙළි උත්සවයක් විය. එදින විශාඛාව තවත් කුමාරිකාවන් පන්සියයක් සමඟ දිය නෑමට ගඟට ගොස් වැසි වසින බැවින් ආපසු පැමිණෙන සන්සුන් ලීලාව දැක විශාඛාව කෙරෙහි පැහැදුනාවූ බමුණෝ ඇයගේ පඤ්ච-කල්‍යාණය දැකීමෙන් තව දුරටත් සතුටට පත් වී මිගාර සිටුවරයාගේ මාළිගාවෙන් ගෙනෙන ලද මාලය ඇයට දමා තොරතුරු දැන්වූහ. පසු ව සිටුකුලයන් දෙක අතර තොරතුරු හුවමාරු කර විශාඛාවත් පූර්ණවර්ධන කුමාරයාත් අතර සරණ මංගල්‍යය සිදු කිරීමට තීරණය විය. ඒ මඟුලට පෙර දින රාත්‍රියේ ධනඤ්ජය සිටුතුමා තම දියණිය කැඳවා කුලයකට පිවිසෙන්නියක විසින් දැන ගත යුතු කරුණු දැන්වී ය. එනම්,

1. ඇතුළත ගිනි පිටතට නො දිය යුතු ය.
2. පිටත ගිනි ඇතුළට නො ගත යුතු ය.
3. දෙන්නාට ම දිය යුතු ය.
4. නො දෙන්නාට නො දිය යුතු ය.
5. දෙන්නාටත් නො දෙන්නාටත් දිය යුතු ය.
6. සුව සේ හිඳිය යුතු ය. සුව සේ කෑ යුතු ය. සුව සේ නිදිය යුතු ය.
7. ගිනි පිදිය යුතු ය.
8. ඇතුළත දෙවියන් වැඳිය යුතු ය.

පසු දිනයේ දී සැවැත් නුවර මිගාර සිටාණන්ගේ පුත් පූර්ණවර්ධන සිටුකුමරු සමඟ විශාඛා කුමරී තොමෝ විවාහ වූවා ය. විවාහ වන දිනයේ දී තම පියාගෙන් නවකෙළක් පමණ වටිනා 'මහාලතා' නම් පළඳනාව ලැබිණි. එම පළඳනාව පැළඳ මහත් පිරිවරින් සැවැත් නුවරට පැමිණියා ය. ඇගේ රූප ශෝභාව දැක නුවරවැස්සෝ පුදුම වූහ.

ඇයගේ මාමණ්ඩිය වූ මිගාර සිටු තෙමේ මිථ්‍යාදෘෂ්ටිකයෙකි. පසු ව විශාඛාවගේ උපදෙස් අනුව බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා සෝවාන් ඵලයට පැමිණියේ ය. එනිසා විශාඛාව 'මිගාර මාතා' යන නමින් ද ප්‍රසිද්ධ වූවා ය.

විශාඛාවෝ පුත් කුමරුවන් දසදෙනෙකුන් ද දූ කුමාරිකාවන් දසදෙනෙකුන්දැයි දරුවන් විසිදෙනෙකුන් ලදහ. එහෙත් ඇයගේ මහලු කමක් නො පෙනේ. තරුණ ගතිය ම පැවතුණි. ඇයගේ සිටුමැදුර සියදහස් ගණන් භික්ෂූන් වහන්සේ නිතර දන් වළඳන තැනෙක් විය. ඕ බුදුසසුන්හි අග්‍රදායිකා තනතුර ලද්දී ය.

දිනක් බණ ඇසීමට විහාරයට ගිය විශාඛාවට තම පළඳනාව එහි දී අමතක විය. ආනන්ද හිමියෝ එම පළඳනාව අරන් තබා එය නැවත ගෙන යාමට පැමිණි දසියට එය රැගෙන යන මෙන් කීහ. ආනන්ද හිමියන් ස්පර්ශ කළ බැවින් දැන් තමාට අයිති නැති බව කී විශාඛාව පසු ව තම පළඳනාව මිල කරවා තමා ම මිලට ගෙන ගෙන එම මුදල් වැය කොට පූර්වාරාම විහාරය කරවූවා ය. විහාරය සඳහා බිම මිලට ගැනීමට නවකෙළක් ද විහාරය සෑදීමට නවකෙළක් ද විහාර පූජාවට නවකෙළක් ද වියදම් කළා ය.

විශාඛා මහෝපාසිකාවෝ පූර්වාරාම විහාරය පූජාව අවසාන දිනයෙහි දී දරුමුනුබුරන් කැටුව ගොස් 'මා පෙර පැතූ සියල්ල මුදුන් පැමිණියේ යැ'යි තුටුපහටු ව පහය වටේ යමින් ගාථා පහකින් උදන් ඇනූහ. (විශාඛාව විසින් සාදා පූජා කරන ලද එම විහාරය පූර්වාරාමය යනුවෙන් ප්‍රසිද්ධ විය.) විශාඛාවගේ මේ උදන් හඬ අසා භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ වෙත එළඹ, "ස්වාමීනී, විශාඛා මහෝපාසිකා තොමෝ දරුමුණුබුරන් සමඟ ගී කියමින් හැසිරේ. ඒ ඇගේ පිත් කිපීමෙන් දැ'යි නො දනිමු"යි කීහ.

එවිට බුදුරජාණන් වහන්සේ "විශාඛාවෝ කියන ගීයක් නැත. ඇයගේ අදහස දැන් සම්පූර්ණ ය. ඒ නිසා තමාගේ ප්‍රාර්ථනා සියල්ල සම්පූර්ණ ය යි උදම් අනමින් හැසිරෙයි.

මහණෙනි, දක්ෂ වූ මාලාකාරයෙක් නොයෙක් පැහැයෙන් යුත් මල් රැසක් එක් කොට නන්වැදෑරුම් මල්දම් යම් සේ ගොතා ද එසේ ම නානා විධ කුශලක්‍රියා කරණයට විශාඛාවගේ සිත නැමේ ය"යි වදරා මේ "**යථාපි පුප්ඵරාසිම්හා**" යන ගාථාව වදාළ සේක.

ධර්මදේශනාවගේ අවසානයේ බොහෝදෙනා සෝවාන් ඵලාදියට පැමිණියෝ ය. දේශනාව මහජනයාට වැඩ සහිත විය.

**ආත්මෝපදේශය** - අතීතය විසින් ඔබ කවරෙක්දැ'යි ඔබට හඳුන්වා දෙයි.

සාධු ! සාධු !! සාධු !!!

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**(ඉල් 2552)**

<u>**සම්පාදක:**</u> පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසි
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

<u>**පිටු සැකසීම:**</u> පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

<u>**ධර්මදානය:**</u> පින්වත් ආර්. ඩී. දයාසීලි උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්ෂා පියරංගිකා මෙණෙවිය විසින් දෙමවුපියන්ට ආශීර්වාද පිණිස හා තමාට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2008**

- *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්‍ද්‍රයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම්ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*